නිපුණතාව 6 - සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 6.3 - විවිධ ප්‍රවේශ ඔස්සේ සාර්ව ආර්ථික සමතුලිතය විශ්ලේෂණය කරයි.

1. සාර්ව ආර්ථික සමතුලිතයේ වෙනසක් ඇති කරන සාධක කවරේද?
2. විදේශ වෙළෙඳාමක් සහිත ආර්ථිකයක ඉතුරුම්වලට වඩා ආයෝජන ඉහළ මට්ටමක පවතී නම් සමතුලිතය කරා ළඟා වීමට ආර්ථිකය හැසිරෙන්නේ කවර ආකාරයකටද?
3. එක්තරා ආර්ථිකයක ස්වාධීන බදු ගුණකය 4ක් යැයි ගණන් බලා ඇත.සමතුලිත ජාතික ආදායම රු.බිලියන 5,000 සිට රු.බිලියන 6,000 සිට වැඩි කිරීමට ආයෝජන කොපමණ ප්‍රමාණයකින් වැඩි කළ යුතුද?
4. කිසියම් ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

ඉතුරුම් ශ්‍රිතය (S) = -200+0.25yd
ආයෝජන (I) = රු.බිලියන 300
ශුද්ධ අපනයනය (Nx) = රු.බිලියන -100
රජයේ අයවැය හිඟය (BD) = රු.බිලියන -50
ශුද්ධ බදු (NTx) = රු.බිලියන 100

1.) සමතුලිත නිමැවුම ගණන් බලන්න.
2.) එම අවස්ථාවේදී කාන්දුවීම් - විදීම් සමාන වන බව පෙන්වන්න.